www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පලාත් පාලන මැතිවරන දේශපාලන වියවුල උත්සන්න කිරීම සඳහා වේදිකාව සකසයි

## Local elections in Sri Lanka set stage for further political turmoil

**කේ. රත්නායක විසිනි**
**2006 අප්‍රේල් 8**

මාර්තු 30 දා පැවති ශ්‍රී ලංකාවේ පලාත් පාලන මැතිවරනයෙන් පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) පැහැදිලි ජයක් ලැබී ඇත. සන්ධානයේ අපේක්ෂක මහින්ද රාජපක්ෂ පසු ගිය නොවැම්බරයේ දී පැවති ජනාධිපතිවරනය යන්තම් ජය ගැනීමෙන් පසුව, එජනිස සිය දේශපාලන ආස්ථානය ඔසවා ගැනීමෙහි ලා මංමුලා සහගත විය. ජාතික මට්ටමින් ගත් කල, සුලුතර එජනිස ආන්ඩුව බලයේ රැඳී සිටින්නේ, ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය යන සිංහල අන්තවාදී පක්ෂ දෙකෙහි සහයෝගය නිසා ම පමනි.

එදින ඡන්ද විමසීම පැවැත්වූ පලාත් පාලන ආයතන 266න් 223ක බලය ලබා ගැනීමට එජනිස සමත් විය. 2002 පැවති මැතිවරනයේ සිට මේ දක්වා ම දිවයිනේ දකුනු ප්‍රදේශවල පලාත් පාලන ආයතන සියල්ලේ ම පාහේ බලය දරා සිටි විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප) ආයතන 32ක් පමනක් ලබා ගනිමින්, කනගාටුදායක දෙවන ස්ථානයකට පැමිනියේ ය. ජනාධිපතිවරනයේ දී රාජපක්ෂට සහයෝගය දී තිබූ ජවිපෙ, වෙනම තරඟ කල අතර එක සභාවක් පමනක් දිනා ගනිමින්, මූලික පසුබැසීමකට මුහුන දුනි.

එජනිස මැතිවරන ප්‍රතිඵල වහා ම වර්නනා කලේ, ආන්ඩුවට "දැවැන්ත ජයග්‍රහනයක්" හා "ජනාධිපති මහින්ද රාජපක්ෂට (නොවැම්බරයේ දී) ලැබුනු ජනවරම යලි තහවුරු වීමක්" ලෙස ය. කෙසේ වෙතත්, මැතිවරන ප්‍රතිඵල ජනාධිපතිට ලැබුනු පුලුල් අනුමැතියක් නොවන අතර එය ඔහුගේ ආන්ඩුව පෙලන දේශපාලන අර්බුදය විසඳා ගැනීමට කිසිදු අයුරකින් දායක වී ද නැත. රාජපක්ෂ විසින් තොරොම්බල් කරනු ලබන සාම සාකච්ඡා, බිඳ වැටීමේ අද්දරකට පැමින ඇති අතර කඩා වැටෙන ජීවන මට්ටම් හේතු කොට ගෙන වැඩෙන සමාජ අසහනයකට ද ඔහු මුහුන දී සිටී.

සමස්ත දේශපාලන සංස්ථාපිතය ම කෙරෙහි ඡන්දදායකයන් අතර පවත්නා කලකිරීම සහ විරසකය, ඡන්දය දුන් සංඛ්‍යාවේ තියුනු වැටීම -- මීට යන්තම් සිවු මසකට පෙර පැවති ජනාධිපතිවරනයේ දී වාර්තා වූ සියයට 75 සිට සියයට 65ක් දක්වා කඩා වැටීමක් -- මගින් පෙන්නුම් කෙරුනි. නොවැම්බරයේ දී රාජපක්ෂට ඡන්ද 4,880,950ක් ලැබුනු නමුත් මාර්තු 30 දා "දැවැන්ත ජයග්‍රහනයේ" දී ඔහුගේ එජනිසයට ලැබුනේ ඡන්ද 3,373,966ක් පමනි. ජවිපෙ වෙනම තරඟ කලේ ය යන්නත් පලාත් පාලන ආයතන 22ක ඡන්ද විමසීම නීතිමය අභියෝග මගින් අත්හිටුවා තිබේ යන්නත් සැලකු කල පවා, ඡන්ද ප්‍රතිපල තියුනු කඩා වැටීමක් නියෝජනය කලේ ය.

දිවයිනේ මධ්‍ය ප්‍රදේශවල දෙමල කතා කරන වතු කම්කරුවන් අතර සිය ඡන්ද වැඩි කර ගෙන සිටින ලංකා කම්කරු කොංග්‍රසය (සීඩබ්ලිව්සී) සහ කඳුරට ජනතා පෙරමුන (යූපීඑෆ්) සමග ඇති කර ගැනුනු මැතිවරන සන්ධානයක් මගින් ද එජනිසට මුක්කුවක් ලැබී ඇත. ඊට අමතරව, පුත්තලම දිස්ත්‍රික්කයේ පලාත් පාලන ආයතන ගනනාවක් ජය ගැනීමට උපකාර කල ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ (ශ්‍රීලමුකො) සහයෝගයෙන් ද සන්ධානය වාසි ලැබී ය.

සම්ප්‍රදායිකව ගත් කල පලාත් පාලන මැතිවරන ජාතිකව බලයේ සිටින ආන්ඩුවට වාසි සහගත වන නිසා, රාජපක්ෂ ඒ සඳහා ක්‍රියාශීලීව උද්ඝෝෂනය කරමින් ද කිසිදාක ඉෂ්ඨ නොකෙරෙන දීර්ඝ පොරොන්දු ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් ද තීරනාත්මක ජයග්‍රහනයක් බලාපොරොත්තුවෙන් ක්‍රියා කලේ ය. එජනිසයට සහයෝගය දීමට අපොහොසත් වන ප්‍රදේශවලට සංවර්ධන අරමුදල් බලාපොරොත්තු විය නොහැකි බව ද ඔහු ඇඟවී ය. දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය සමග පැවැත්වෙන සාම සාකච්ඡාවලට එරෙහිව ජවිපෙ හා හෙල උරුමය ගෙන යන ස්වෝත්තමවාදී උද්ඝෝෂනයට ඔහු විවෘතව අභියෝග නොකල නමුත්, රටේ 20-අවුරුදු සිවිල් යුද්ධයේ අවසානයක් දැකීමට අවශ්‍ය බහුතරයක් ඡන්දදායකයන්ට ආයාචනා කරනු පිනිස එජනිස සාමයේ පක්ෂයක් ලෙස පින්තාරු කිරීමට රාජපක්ෂ ප්‍රයත්න දැරී ය.

එජනිසයේ අඛන්ඩ දුර්වලත්වය පෙන්නුම් කරන එක් දර්ශකයක් වූයේ, පැහැදිලි පාර්ලිමේන්තු බහුතරයක් ලබා ගනු පිනිස ජනාධිපති අලුත් මහ මැතිවරනයක්

කැඳවීමට ඉඩ ඇතැයි මාධ්‍ය කල සමපේක්ෂනයකට එය දැක්වූ ප්‍රතිචාරයයි. රාජපක්ෂගේ සමීප සගයන් එවන් යෝජනාවක් සාකච්ඡාවට ලක් කරන බවට මාධ්‍ය වාර්තා පල වූ පසු, කැබිනට් අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මහ මැතිවරනයක් සඳහා පවත්නා ඉඩකඩ ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප කලේ ය. එම තීන්දුව වෙනස් විය හැකි නමුදු, දෙගිඩියාව මගින් එලිදරව් වන්නේ, සන්ධානය ශක්තිමත් තත්වයක නොපවතින බවට එජනිස නායකත්වය තුල ම ඇති උත්සුකතාවයි.

විපාර්ශ්වික එජාපය එජනිසයට පැහැදිලි විකල්පයක් ඉදිරිපත් නොකල අතර සැලකිය යුතු පරාජයක් අත්වින්දේ ය. එහි ඡන්ද ප්‍රමානය නොවැම්බරයේ දී ලද 4,694,623 සිට 2,410,631 දක්වා කඩා වැටුනි. එජාජ නායක රනිල් වික්‍රමසිංහ, ජීවන මට්ටම් කඩා වැටීමට විසඳුම ලෙස සිය වෙලඳ පොල ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රය තොරොම්බල් කිරීම මත සිය මැතිවරන ව්‍යාපාරය පදනම් කල අතර, එය කිසිදු උද්යෝගයක් ජනනය කිරීමට අසමත් වීම මවිතයට කරුනක් නොවේ. 2002 සිට 2004 දක්වා බලයේ සිටි ඔහුගේ එජාප-නායකත්වයෙන් යුත් ආන්ඩුව, මෙම ආර්ථික පිලිවෙත්වල බලපෑම හේතු කොට ගෙන, පුලුල් ලෙස වෛරයට ලක් විය.

ජනාධිපතිවරනයෙන් සහ දැන් පලාත් පාලන මැතිවරනයෙන් පරාජයට පත්ව ඇති එජාපය කාන්ඩමික කාකොටා ගැනීම්වලින් ඉරිතලා ඇත. වික්‍රමසිංහ මෑත ම පරාජය සම්බන්ධයෙන් සිය කාන්ඩමික විරුද්ධවාදීන්ට බැන වැදී තිබේ. ඔහු හිටපු ධීවර ඇමතිවරයකු වූ මහින්ද විජේසේකර, පක්ෂ කෘත්‍යාධිකාරී කමිටුවෙන් ද මැතිවරනයෙන් පක්ෂය අතුගෑවීමකට ලක්ව ඇති මාතර ප්‍රදේශයේ සම-සංවිධායක තනතුරෙන් ද ඉවත් කලේ ය. ඊට පිලිතුරු වසයෙන්, විජේසේකර "අකාර්යක්ෂම නායකත්වයක්" යැයි වික්‍රමසිංහට චෝදනා කර තිබේ. ජනාධිපති ජවිපෙන් හා හෙල උරුමයෙන් ඈත් වුන හොත් එජාප නායකයන් කන්ඩායමක් රාජපක්ෂට සහයෝගය දීමට සූදානම්ව සිටින බව විජේසේකර බීබීසී ප්‍රවෘත්ති සේවයට පැවසී ය.

මැතිවරන ප්‍රතිඵලවල වඩාත්ම වැදගත් අංශය නම්, සාමාන්‍යයෙන් "මාක්ස්වාදීන්" ලෙස සාවද්‍යව පින්තාරු කෙරෙන එහෙත් සිංහල ස්වෝත්තමවාදයේ හා ජනතාවාදී වාචාලත්වයේ මිශ්‍රනයක් මත පාදක වන, ජවිපෙ ලද සහයෝගය බිඳ වැටීම යි. ප්‍රධාන ධනේශ්වර පක්ෂ පිලිබඳ මහජන පිලිකුල ගසාකෑමෙන් සැලකිය යුතු මැතිවරන වාසි ලබා ගැනීමට ජවිපෙ සමත් වී තිබේ. කෙසේ වෙතත්, 2004 දී, එජනිස ආන්ඩුවේ කොටසක් ලෙස, ප්‍රථම වතාවට බලයට පත් වූ, ජවිපෙ, තමන්ගේ පොරොන්දුවලින් බොහොමයක් ඉටු නොකෙරුනු හෙයින්, සිය සහයෝගී පදනම් ශීඝ්‍රයෙන් අහිමි කර ගත්තේ ය. අවසානයේ පසු ගිය ජූනි මස එය සභාගයෙන් ඉවත් වූ අතර, ජනාධිපතිවරනයේ දී තමන්ගේ ම අපේක්ෂකයකු ඉදිරිපත් නොකොට ඒ වෙනුවට රාජපක්ෂට සහයෝගය දුනි.

එහෙයින් පලාත් පාලන මැතිවරනය ජවිපෙ සඳහා තීරනාත්මක පරීක්ෂනයක් වූ අතර පක්ෂය මැතිවරන ව්‍යාපාරය වෙනුවෙන් සැලකිය යුතු සම්පත් ප්‍රමානයක් ආයෝජනය කලේ ය. පලාත් පාලන ආයතන 28ක පාලනය එයට සහතික කරන ආකාරයේ මැතිවරන සන්ධානයකට එන ලෙස රාජපක්ෂ කල යෝජනාව ජවිපෙ ප්‍රතික්ෂේප කලේ ය. එහි පුම්බන ලද මැතිවරන ප්‍රචාරක ව්‍යාපාරය ප්‍රකාශ කලේ, පක්ෂය පලාත් පාලන ආයතන සියයක් පමන දිනා ගෙන රටේ "දෙවන දේශපාලන බලය" බවට පත් වන බවයි. පක්ෂය "රට පුරා රැස්වීම් 12,000ක් පමන" පවත්වා ඇති බවත් "ඓතිහාසික ජයග්‍රහනයකින් නැගී සිටීම ගැන විශ්වාස" බවත් මාර්තු 29 දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, ජවිපෙ ලේකම් ටිල්වින් සිල්වා කියා සිටියේ ය.

ජවිපෙ පාර්ලිමේන්තු කන්ඩායමේ නායක විමල් වීරවංශ මෙසේ පුරසාරම් දෙඩී යː "ජවිපෙ ප්‍රධාන පක්ෂයක් ලෙස මතු වීම රටේ දේශපාලන භූදර්ශනය වෙනස් කරනු ඇත. මෙම මැතිවරනය, අප සතු ජනතා බලයත් අපගේ ඡන්ද පදනමත් ප්‍රදර්ශනය කරනු ඇත. ජවිපෙ වනාහි අනාගතයේ දී රටේ පාලනය භාර ගැනීමට සිටින පක්ෂය බව එය පැහැදිලිව ම ඔප්පු කරනු ඇත.

මැතිවරනයේ දී, ජවිපෙ සමත් වූයේ 2002 දී එය ජය ගෙන තිබූ ඈත දකුනේ තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බලය රැක ගැනීමට පමනි. එම ප්‍රාදේශීය සභාවේ ජවිපෙ ඡන්ද සංඛ්‍යාව 2002 දී තිබූ 11,584 සිට 12,394 දක්වා වැඩි වී තිබේ. ජවිපෙ ලබා ගත් සමස්ත ඡන්ද ප්‍රමානය 822,804ක් වූ අතර 2002 දී 200ක් පමන වූ දිවයින පුරා ජවිපෙ පලාත් පාලන සභිකයන්ගේ සංඛ්‍යාව 362 දක්වා වැඩි විය.

ප්‍රාදේශීය සංවර්ධනයට රුකුල් දෙන බවට පොරොන්දු වූ අතර ම, ජවිපෙ උද්ඝෝෂනය තුල ආධිපත්‍යය දැරුවේ වත්මන් සාම සාකච්ඡාවලට එරෙහි ප්‍රකෝපකාරී ප්‍රකාශ ය. වත්මන් සටන් විරාමය මූලික සංශෝධනයන්ට ලක් කල යුතු යැයි ජවිපෙ කරන ඉල්ලීම්වල තර්කනය වන්නේ, ජීවිත 65,000ක් බිලි ගෙන ඇති සිවිල් යුද්ධය කරා රට යලි ඇද වැටීම යි. මෙම ඉල්ලීම දැනටමත් එල්ටීටීඊය මුලුමනින් ම ප්‍රතික්ෂේප කර ඇත. ජවිපෙ ප්‍රතික්ෂේප වීම, බොහෝ ඡන්දදායකයන්ට යුද්ධය නොව සාමය අවශ්‍ය ය යන්න පිලිබඳ තවත් දර්ශකයකි.

එහි පරාජය නැගෙනහිර යුද කලාපවල වඩාත් ප්‍රකට විය. ජවිපෙ නැගෙනහිර ජනතාව ආරක්ෂා කිරීමේ සංවිධානය ගොඩ නගා සිංහල හා දෙමල ජනයා අතර

වාර්ගික ආතතීන් ඇවිලවීමේ එල්ලයෙන් යුත් ප්‍රකෝපකාරී උද්ඝෝෂනයක් ගෙන ගියේ ය. එහෙත් ජවිපෙ අති මහත් බහුතරයක් ඡන්දදායකයන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුනි. අම්පාරේ දී එයට ලබා ගත හැකි වූයේ ඡන්ද 1,200ක් පමනක් වන අතර ත්‍රිකුනාමලයේ ලැබුනේ ඡන්ද 845කි.

ජවිපෙ නායකයන් ප්‍රසිද්ධියේ මැතිවරන පරාජය එතරම් දෙයක් නොවන බව පෙන්වීමට උපරිම වෙහෙසක් දරා ඇත. ඔවුන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ බලය රැක ගැනීම, සභිකයන් සංඛ්‍යාව වැඩි වීම සහ පලාත් පාලන ආයතන ගනනාවක දී එජාපය පරාජය කිරීමට තමන් සමත් වීම "ජයග්‍රහන" ලෙස හුවා දක්වා තිබේ. එහෙත් අප්‍රේල් 5 දා ඩේලි මිරර් පත්‍රය සමග පැවති සම්මුඛ සාකච්ඡාවක දී ජවිපෙ නායක වීරවංශ, "බලාපොරොත්තු වූ දීප්තිය මෙමම ජයග්‍රහනය තුල නැති" බව පිලිගත්තේ ය.

තමන් රාජපක්ෂට දිගට ම සහයෝගය දෙන බවත් එහෙත් ඒ ඔහු ජනාධිපතිවරනය සඳහා ජවිපෙ සමග ඇති කර ගත් සිය මැතිවරන ගිවිසුමේ අඩංගු පොරොන්දුවලට ගරු කරන්නේ නම් පමනක් බවත්, දේශපාලන කමිටු ප්‍රකාශයක් තුල ජවිපෙ කියා සිටියේ ය. මැතිවරන පරාජයට ජවිපෙ දක්වා ඇති ප්‍රතිචාරය නම්, ඊනියා සාම ක්‍රියාදාමයට එරෙහිව ස්වොත්තමවාදී උද්ඝෝෂනය උත්සන්න කිරීම යි. ජවිපෙ පෙරමුනු සංවිධානය වන දේශහිතෛෂී ජාතික ව්‍යාපාරය (දේජාව) දීප-ව්‍යාප්ත උද්ඝෝෂනයක් දියත් කරන බවට, මේ සතියේ නිවේදනය කලේ ය.

ජවිපෙහි සිංහල අන්තවාදී ප්‍රතිවාදියා වන, බෞද්ධ ධුරාවලියේ හා රාජ්‍ය යන්ත්‍රයේ කොටස් තුල පදනම්ව සිටින හෙල උරුමය ඊටත් වඩා දරුනු පරාජයක් ලබා ඇත. 2004 මහ මැතිවරනයේ දී එයට ඡන්ද 552,724ක් ලැබුනු නමුත් පලාත් පාලන මැතිවරනයේ දී එයට ලබා ගත හැකි වූයේ එයින් දහයෙන් පංගුවකි, එනම් 59,942කි.

එල්ටීටීඊ-ගැති දෙමල ජාතික සන්ධානයේ (ටීඑන්ඒ) මැතිවරන පෙරමුනක් වන ඉලංකෙයි තමිල් අරසු කච්චි (අයිටීඒකේ), ත්‍රිකුනාමලය නගර සභාව ඇතුලුව, ත්‍රිකුනාමල දිස්ත්‍රික්කයේ පලාත් පාලන ආයතන 5ක් දිනා ගත්තේ ය. මෙමම ප්‍රතිඵලය සිංහල ජාතිකවාදීන් ලද "පරාජයක්" ලෙස වහාම ප්‍රකාශ කර සිටි ටීඑන්ඒ සංවිධානය, එජනිසය ලද ඡන්ද සාම සාකච්ඡා සඳහා ලැබුනු ජනවරමක් ලෙස වර්නනා කලේ ය.

මහ ව්‍යාපාරිකයන් සහ මහ බලවතුන් මැතිවරන ප්‍රතිඵල අර්ථදක්වා ඇත්තේ සාම සාකච්ඡා ඉදිරියට ගෙන යාමට ලැබුනු අවස්ථාවක් ලෙස යි. නෝර්වේ හිටපු විශේෂ නියෝජිත එරික් සොල්හෙයිම් මේ සතියේ දී කොලඹ සංචාරයක යෙදුනේ ය. බදාදා රාජපක්ෂ මුන ගැසීමෙන් පසුව ඔහු මාධ්‍යවලට මෙසේ පැවසී ය: "පලාත් පාලන මැතිවරන ප්‍රතිඵල (සාකච්ඡා) ක්‍රියාදාමය ඉදිරියට ගෙන යාම පිනිස මහින්ද රාජපක්ෂට ලැබුනු පැහැදිලි ජනවරමකි."

කෙසේ වෙතත්, එල්ටීටීඊය සමග යම් එකඟතාවකට පැමිනීම පසෙක තිබියේවා, සාකච්ඡා ඉදිරියට ගෙනයාම සම්බන්ධයෙන් සැලකිය යුතු දේශපාලන ගැටලුවලට රාජපක්ෂ මුහුන දී සිටී. වත්මන් සටන් විරාමයටත් පහසුකම් සපයන්නා ලෙස නෝර්වේ ඉටු කරන භූමිකාවටත් රුදුරු ලෙස විරුද්ධව සිටින ජවිපෙන් හා හෙල උරුමයෙන් ලැබෙන පාර්ලිමේන්තු සහයෝගය මත රාජපක්ෂගේ සුලුතර ආන්ඩුව තවමත් රදා පවතී. එපමනක් නොව, ඔහුගේ ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ද සිංහල ස්වෝත්තමවාදය තුල ගැඹුරට ම ගිලී සිටින අතර එනයින් ජවිපෙ වර්ගෝත්තමවාදී උද්ඝෝෂනයෙන් එල්ල කෙරෙන පීඩනයට එය පහසුවෙන් ගොදුරුවන සුලු ය. රාජ්‍ය යන්ත්‍රයේ කොටස්, විශේෂයෙන් ම මිලිටරිය, එල්ටීටීඊයට මොන යම් හෝ සහනයක් දීමට ගැඹුරින් ම සතුරු ය. ඊලඟ සාකච්ඡා වටය අප්‍රේල් 19-21 දිනවල පැවැත්වීමට නියමිත ය.

මහ බලවතුන්ගේ හා මහ ව්‍යාපාරිකයන්ගේ අනුග්‍රහය ලබන "සාම ක්‍රියාදාමය" ශ්‍රී ලංකාවේ වැඩ කරන ජනයාට කිසිදු වාසියක් අත්පත් කර දෙනු නැත. එහි එල්ලය වන්නේ, දිවයින, ලාභ ශ්‍රම වේදිකාවක් ලෙස භූගෝලීය නිෂ්පාදන ක්‍රියාදාමයන්ට වඩා සමීපව ඒකාග්‍ර කරගනු සඳහා මාවත විවෘත කරන වාර්ගිකව-පදනම් වූ බලය බෙදා ගැනීමේ සැකැස්මකි. ඕනෑම "සාම" ගිවිසුමක්, කම්කරු පන්තියේ සමාජ තත්වයට තව දුරටත් වල කපනු ඇති ආර්ථික ප්‍රතිව්‍යුහකරනයේ නව ම්ලේච්ඡ වටයක් සමග එකට බැඳෙනු ඇත.

එජනිසයට සිය මැතිවරන පොරොන්දු ඉටු කිරීමේ කිසිදු අභිප්‍රායක් නැති බවටත් එය වෙලඳ පොල ප්‍රතිසංස්කරන ක්‍රියාවට දමනු ඇති බවටත් පවත්නා පැහැදිලිම සංඥාව නම්, වැටුප් වැඩිවීමක් සඳහා රාජ්‍ය අංශයේ කම්කරුවන් කර ඇති ඉල්ලීමට රාජපක්ෂ දක්වා ඇති ප්‍රතිචාරයයි. සඳුදා ශ්‍රීලනිපයට අනුබද්ධිත වෘත්තීය සමිති සම්මේලනය අමතමින්, එදින විරෝධතාවක යෙදුනු 200,000ක් කම්කරුවන්ට ජනාධිපති අනතුරු ඇඟවූයේ, "තම අයිතීන් ඉල්ලා සිටීමට වෘත්තීය සමිති ක්‍රියාවන්ට එලඹීමට පලමුව රට වෙනුවනේ තම යුතුකම ඉටු කරන" ලෙසටයි.

ආන්ඩුවේ අර්බුදයේ මොන යම් හෝ අංශයක් විසඳාලනවා වෙනුවට, මැතිවරනය එම අර්බුදය තව දුර උත්සන්න වීම සඳහා වේදිකාව සකසයි.

© www.wsws.org